# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# වී අලෙවි මණ්ඩලය

**ටෙන්ඩර් සඳහා ආරාධනය**

## අනුරාධපුර, මාතලේ, පුත්තලම, ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලට අයත් වී අලෙවි මණ්ඩලය සතු මෙට්‍රික් ටොන් 15,000ක වී ප්‍රමාණයක් ටෙන්ඩර් කැඳවා විකිණීම

| ලොට් අංකය | ටෙන්ඩර් අංකය |
|---|---|
| 03 | PMB/2026/NP/003 |

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් උක්ත ටෙන්ඩරය වෙනුවෙන් වී අලෙවි මණ්ඩලය සතු අනුරාධපුර, මාතලේ, පුත්තලම, ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවලට අයත් වී ගබඩාවල පවතින මෙට්‍රික් ටොන් 15,000ක වී අලෙවි කිරීම වෙනුවෙන් 2026 වර්ෂය සඳහා ලියාපදිංචි වී මෝල් හිමියන්ගෙන් මුද්‍රා තැබූ ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| ලොට් අංකය | ටෙන්ඩර් අංකය | ටෙන්ඩර් නාමය සහ ස්ථානය | ගබඩා පවතින දිස්ත්‍රික්ක | සුදු නාඩු වී ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | රතු නාඩු වී ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|---|
| 03 | PMB/2026/NP/003 | අනුරාධපුර, මාතලේ, පුත්තලම, ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලට අයත් වී අලෙවි මණ්ඩලය සතු මෙට්‍රික් ටොන් 15,000ක වී ප්‍රමාණයක් ටෙන්ඩර් කැඳවා විකිණීම | අනුරාධපුර | 11,848.187 | 485.513 |
| | | | මාතලේ | 74.008 | - |
| | | | පුත්තලම | 2,142.726 | - |
| | | | ගම්පහ | 54.918 | 0.733 |
| | | | කුරුණෑගල | 368.961 | 24.954 |

1) මිල ගණන් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරු වී අලෙවි මණ්ඩලයේ 2026 වර්ෂය සඳහා ලියාපදිංචිය සහිත වී මෝල් හිමියකු විය යුතුයි.

2) ඒ ඒ ගබඩාවේ පවතින විකිණීමට යෝජිත වී තොගය සම්පූර්ණයෙන්ම හෝ අවම මෙට්‍රික් ටොන් 10ක් හෝ උපරිම මෙට්‍රික් ටොන් 15,000ක් දක්වා උපරිමයකට යටත්ව වී තොග මිලදී ගත හැකිය.

3) මෙම ටෙන්ඩරයට අදාළ සියළු විස්තර සහ ටෙන්ඩර් ලියකියවිලි වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් (0112-335414) හා පහත දැක්වෙන ප්‍රාදේශීය කාර්යාලවලින් ලබා ගැනීමේ හැකියාව ඇත.

| ප්‍රාදේශීය කාර්යාලයේ නම | දුරකතන අංකය |
|---|---|
| උතුරු කලාප කාර්යාලය | 021 – 2060 913 |
| අම්පාර කලාප කාර්යාලය | 063 – 2224 870 |
| දකුණු කලාප කාර්යාලය | 047 – 2225 514 |
| නැගෙනහිර කලාප කාර්යාලය | 026 – 2226 691 |
| පොළොන්නරුව කලාප කාර්යාලය | 027 – 2222 407 |
| වයඹ කලාප කාර්යාලය | 037 – 2260 628 |
| අනුරාධපුර කලාප කාර්යාලය | 021 – 2060 913 |

4) ටෙන්ඩර් ලියවිලි වී අලෙවි මණ්ඩලයේ ඉහත දක්වන ලද ප්‍රධාන / ප්‍රාදේශීය කාර්යාල වෙතින් ඉහත දක්වන ලද සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කිරීමෙන් පසු 2026.07.24 දින දක්වා සතියේ දිනයන් තුළ පෙ.ව 09.00 සිට ප.ව. 3.00 දක්වා නැවත නොගෙවන රු. 3,500.00 ක ගාස්තුවක් ගෙවා ලබා ගත හැකිය.

5) ටෙන්ඩරය ඉදිරිපත් කිරීමේදී මෙට්‍රික් ටොන් 1ක් සඳහා රු. 1300.00 ක් බැගින් මිලදී ගැනීමට අපේක්ෂිත වී මෙට්‍රික් ටොන් ප්‍රමාණය අනුව ගණනය කරනු ලබන ලංසු සුරක්ෂණයක් / බැංකු අණකරයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබා ගෙන හෝ ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක් ලෙස වී අලෙවි මණ්ඩලයේ පහත අංක දරණ ගිණුමේ තැන්පත් කර ලබා ගත් රිසිට්පතේ ඡායා පිටපත ඉදිරිපත් කළ යුතුය.

   මුදල් තැන්පත් කළ යුතු බැංකු ගිණුම් විස්තර
   ගිණුම් අංකය - 6662403
   ගිණුම් හිමියාගේ නම - වී අලෙවි මණ්ඩලය
   බැංකුව - ලංකා බැංකුව
   ශාඛාව - රාජගිරිය

6) පවතින වී තොගවල භෞතික තත්ත්වය 2026.07.06 දින සිට 2026.07.20 දින දක්වා රාජකාරි දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පරීක්ෂා කර බැලිය හැකිය.

7) මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර පහත දුරකතන අංක මගින් වී අලෙවි මණ්ඩලයේ සභාපති හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) ඇමතීමෙන් විමසිය හැකිය.


<u>ලිපිනය</u>
සභාපති
වී අලෙවි මණ්ඩලය
6 වන මහල, නිවාස මහලේකම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

<u>දුරකතන අංකය</u>
0112-335414
ඊමේල් – pmbgeneralmanager@gmail.com

8) නියමිත පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් 2026.07.27 දින පෙ.ව. 11.00ට පෙර, පහත සඳහන් ලිපිනයේ පිහිටි කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ පළමු මහලේ ප්‍රසම්පාදන කළමනාකරණ අංශයේ මේ සඳහා වෙන් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ එම ලිපිනයට ඉහත දක්වා ඇති දින නියමිත වෙලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලස්විය යුතුය. මිල ගණන් බහාලන කවරයේ ඉහල වම්පස කෙලවරෙහි "වී අලෙවි මණ්ඩලය සතු 2026 වර්ෂයේ වී තොග විකිණීම - PMB/2026/NP/003" ලෙස සටහන් කළ යුතුය. 2026.07.27 දින පෙ.ව. 11.00න් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,<br>
ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව,<br>
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,<br>
අංක. 80/5,<br>
"ගොවිජන මන්දිරය",<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

9) ටෙන්ඩර් විවෘත කිරීම 2026.07.27 වන දින පෙ.ව. 11.15ට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ පළමු මහලේ ශ්‍රවනාගාරයේ දී සිදු කෙරේ. ඒ සඳහා ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

10) ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ටෙන්ඩරයකින් කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආදී සියලු කරුණු සම්බන්ධව අවසාන තීරණය ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව සතුය.

සභාපති,<br>
ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව,<br>
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,<br>
අංක. 80/5,<br>
"ගොවිජන මන්දිරය",<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.<br>
2026.07.06